#mediaethicsSL #SinhalaPress #lka #Divaina #October4

යම් කිසි සිදුවීමකට බාලවයස්කරුවෙකු සම්බන්ධ වන විට, එම බාලවයස්කරුගේ අනන්‍යතාවය සඳහන් නොකළ යුතු යැයි කියැවෙන්නේ, ඕනෑම බාලවයස්කරුවෙකුට සිය පාසැල් අධ්‍යාපනය බාධාවකින් තොරව නිමා කිරීමේ අයිතියක් පවත්නා බැවිනි. දිවයින පුවත්පතේ මෙම පුවත දෙස බලනා විට එහි බාලවයස්කාර වින්දිතයාගේ නම හෝ ඔහුගේ අනන්‍යතාවය සෘජුවම හෙළිදරවු වන තොරතුරක් ලබාදී නොමැති බව දැකිය හැක. එනමුත් එහි මෙම බාලවයස්කරුවාගේ පාසැලේ නම සඳහන්ව තිබේ. මෙහිදී පාසැලේ නම සඳහන් කිරීම මගින් බාලවයස්කාර වින්දිතයාගේ අනන්‍යතාවය හෙළිදරවු වීමේ හැකියාවක් තිබෙනා බවට යමෙකු තර්ක කරනා විට, එවැනි හැකියාවක් නොමැති බවට තවත් අයෙකු තර්ක කළ හැක. එසේම පාසැලේ නම මෙම ප්‍රවෘත්තියට සෘජුවම අවශ්‍ය වන්නේද යන කාරණය සම්බන්ධයෙන්ද යමෙකුට පක්ෂව මෙන්ම විපක්ෂව තර්ක කළ හැක. මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?